**ශීර්ෂය 105 - ජනමාධ්‍ය අමාත්‍යාංශය**
------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූනි 03 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූනි 06 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,

චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මෙම වාර්තාවේ 1.6.1 ඡේදයේ නිරීක්ෂණ හැර මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අංක **SA/MAA/**02/01/01 දරන 2021 නොවැම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක: 2021/03 හි 7.9 අනුව මූල්‍ය කාලසීමාව අවසානයේ එක් එක් වාර්තාකරණ ආයතනය විසින් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලද මුදල් ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මුදල් සහ මුදල් | 2021 වර්ෂයේ ගිණුමට අදාළව 2020 වර්ෂයේ සංසන්දනාත්මක සංඛ්‍යා සටහන් කිරීමේදී 2021 වර්ෂයේ සංඛ්‍යාවලට අනුරූපී වනසේ අගය සටහන් කිරීම නිසා මෙය සිදුවී ඇත. | සංසන්දනය කළ හැකි වන අයුරින් මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාන දැහි ශේෂයට ඇතුළත් නොකළ යුතු නමුත් 2020 වර්ෂය සඳහා සංසන්දනාත්මක සංඛ්‍යා දැක්වීමේදී මූල්‍ය කාලසීමාව අවසානයේ භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලද රු.4,771,962 මුදල් ශේෂය**,** මුදල් හා මුදල් සමාන දැ ලෙස දක්වා තිබුණි. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ඉකුත් වර්ෂයට අදාල ලැබීම් හා ගෙවීම් විෂයන් 03 කට අදාල සංසන්දනාත්මක අගයන් හා ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පැවති එම අගයන් අතර එකතුව රු.14,646,945 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේද වියදම් විෂයන් තුනකට අදාලව එලෙස පැවති වෙනස රු.83,884,130 ක් විය. | -එම- | -එම- |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **ආදායම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හිඟ ආදායම්වලට අදාලව 2020 වර්ෂයේ අවසානයට පැවති අගය හා 2021 වර්ෂයේ ආරම්භයේ පැවති අගය අතර රු.32,966,630 ක වෙනසක් පැවතුණි. | 2020 වර්ෂයේ හිඟ ආදායම් රු.20,190,500 ක් බව අමාත්‍යාංශය සතු තොරතුරු අනුව සනාථ වේ. එය රු. 53,157,130 ක් ලෙස දක්වා තිබීම තව දුරටත් සොයා බලා වාර්තා කරමි. | අවසාන හිඟ ආදායම් ශේෂය සමාලෝචිත වර්ෂයේ හිඟ ආදායම් ආරම්භක ශේෂය ලෙස දැක්විය යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 85(1) ඇ සහ මු.රෙ.143(1) ප්‍රකාරව හා භාණ්ඩාගාර ලේකම්ගේ 2015 ජූලි | 2006 අංක 11 දරන මුදල් පනතේ 08 වන නියෝගයේ (ඇ) ජේදයේ (III) අයිතමය, 2020.03.27 දිනැති 2168/09 | ආදායම් ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පුරෝකථනය කිරීමට |

| | | |
|---|---|---|
| 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 03 වන ඡේදය ප්‍රකාරව ආදායම් නිවැරදිව පුරෝකථනය කළයුතු වුවද සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු.700,000,000 ක් හා ලද ආදායම රු.438,470,000 ක් වූයෙන් විචලනය සියයට 37 ක් විය. | දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධනය කිරීම නිසා ආනයනික ටෙලි නාට්‍ය හා චිත්‍රපට සඳහා අයකරන ලද බද්ද එදින සිට 2021.02.09 දින දක්වා අවලංගු කරන ලදි. රටේ පවත්නා කෝවිඩ් 19 තත්ත්වය හා ආර්ථික දුෂ්කරතා හේතුවෙන් රූපවාහිනී නාලිකා විසින් විකාශනය කරනු ලබන ආනයනික ටෙලි නාට්‍ය හා රූපවාහිනී වැඩසටහන් සීමා කිරීමද බදු ආදායම අඩුවීමට බල පා ඇත. | කටයුතු කළ යුතුය. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ජාතික මාධ්‍ය මධ්‍යස්ථානය සඳහා වූ වැය විෂයන් 03 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඉතිරිව තිබියදී එම වැය විෂයයන් සඳහා රු.7,245,000 ක පරිපූරක ප්‍රතිපාදන ලබාගෙන ඉන් රු.18,100,000 ක් මු.රෙ.66 මගින් වෙනත් වැය විෂයයන්ට මාරුකර තිබුණි. | 2021 වර්ෂයේ අමාත්‍යාංශයේ සාමාන්‍ය පරිපාලන කටයුතු සඳහා අයවැය ඇස්තමේන්තුවේ සලසා තිබූ ප්‍රතිපාදනවලට අමතරව එම වර්ෂයේ මුල් භාගයේදී ජාතික මාධ්‍ය මධ්‍යස්ථානය අළුතින් පිහිටවනු ලැබූ අතර එහි වියදම් සඳහා පරිපූරක ප්‍රතිපාදන වශයෙන් රු.7,245,000 ක් මුල් ප්‍රතිපාදනයට අමතරව භාණ්ඩාගාරයෙන් වෙන් කර ඇත. | නිසි කළමනාකරණයකින් පරිපූරක ප්‍රතිපාදන ලබාගත යුතුය. |
| (ආ) මු.රෙ.50 ප්‍රකාරව සහේතුකව පූර්වානුමාන කළ හැකි සියලුම සේවාවන් ඇස්තමේන්තුවල ඇතුළත් කර ඇති බවට සහ ඒවා මුදල් වර්ෂය තුළ තම දෙපාර්තමේන්තුවට ඉටු කළ හැකි ශක්තිය ඇති බවටත් | 2021 වර්ෂයේ රට තුළ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වයේ උපරිම අවස්ථාව තුළ නිරෝධායන ඇදිරි නීති, කාර්යාල කටයුතු සීමා වීම් ආදී කරුණු හේතුවෙන් සැලසුම් කල කාර්යයන් අපේක්ෂිත පරිදි ඉටු නොවීම මෙන්ම | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව කර ප්‍රතිපාදන කළමනාකරණය කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කර ඇති බවටත් ගණන්දීමේ නිලධාරියා වගබලා ගතයුතු වුවද ඇස්තමේන්තු වෙනස් කිරීමේ විචලතාවය සියයට 100 ත් සියයට 2,156 ත් පරාසක් ගෙන තිබුණි. | අනපේක්ෂිත කාර්යයන් යෙදීම මත මෙම ප්‍රතිපාදන කළමනාකරණය කර ගැනීමේ අපහසුතා ඇතිවිය. | |
| (ඇ) | වැය විෂයයන් 32 ක එකතුව රු.511,495,135 වශයෙන් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 සිට සියයට 100 දක්වා ඉතිරිවීම් පැවති අතර ඉන් වැය විෂයයන් 11 ක ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 මඟින් වෙනත් වැය විෂයයන්වලට මාරු කිරීමෙන් පසුද රු.278,204,025 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. | 2021 වර්ෂයේ රට තුළ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වයේ උපරිම අවස්ථාව තුළ පැවති නිරෝධායන ඇඳිරි නීති හා කාර්යාල කටයුතු සීමා වීම් ආදී කරුණු හේතුවෙන් සැලසුම් කල කාර්යයන් අපේක්ෂිත පරිදි ඉටු නොවීම මෙන්ම අනපේක්ෂිත කාර්යයන් යෙදීම මත මෙම ප්‍රතිපාදන කළමනාකරණය කර ගැනීමේ අපහසුතා ඇතිවිය. | ප්‍රතිපාදන කාර්යක්ෂමව කළමනාකරණය කරගත යුතුය. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේ නිරවුල් කළ රු.682,135 ක් වූ බැඳීම් හා බැරකම් 12 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | බැඳීම් හා බැරකම් ලයිස්තු සකස් කරන අවස්ථාව වන විට ඉදිරිපත් වී නොතිබුණු බැරකම් මෙසේ සඳහන්ව ඇත. | බැඳීම් හා බැරකම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

**2.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

---------------------------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී මෙම සමාලෝචනයන් සිදු කිරීමට කටයුතු කරනු ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණ<br>නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | <br>අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ 135 | ගණන්දීමේ නිලධාරියා විසින් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය බලතල පැවරීමක් සිදුකර නොතිබුණි. | 2022 වර්ෂයට සකස් කරනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) 2020 අගෝස්තු 28 දිනැති 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය (i) I කොටසේ 9 මඟින් සංශෝධිත මු.රෙ. 371(5) ඡේදය | තත්කාර්යය අතුරු අග්‍රිමය ලබාගන්නා මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිම පියවිය යුතු වුවත් රු. 332,826 ක අතුරු අග්‍රිම දින 32 සිට දින 150 ක් දක්වා ප්‍රමාදවී පියවීම් සිදුකර තිබූ අවස්ථා 16 ක් නිරීක්ෂණය විය. | පිළිතුරු ලැබී නැත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) I කොටසේ 11.1 මඟින් සංශෝධනය කරන ලද මු.රෙ. 756(6) | වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව එළඹෙන මුදල් වර්ෂයේ මාර්තු 31 ට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ සමීක්ෂණ වාර්තා 2022 අප්‍රේල් 27 දිනය වන විටද ඉදිරිපත් කර නොතිබුණි. | 2022 වර්ෂයේ මුල් කාලය තුළ ලංකාවේ පැවති තත්ත්වයන් මත සේවක පැමිණීම සීමා කිරීම මෙන්ම අමාත්‍යාංශයේ නවීකරණ කටයුතු අතරතුර සමීක්ෂණය කිරීමේ ප්‍රායෝගික ගැටලු මත ප්‍රමාද විය. මේ වන විට 2021 | -එම- |

| | | |
|---|---|---|
| | | වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර අවසන් අදියරේ පවතී. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**3.1 සැලැසුම් කිරීම**

-----------------

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් පාලන අංශයේ ක්‍රියාකාරකම් 6 ක, මාධ්‍ය අංශයේ ඇසිදිසි පෙරමඟ යටතේ ක්‍රියාකාරකම් 7ක සහ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ අංශයේ ක්‍රියාකාරකම් 4 ක ප්‍රගතිය, ප්‍රගති සමාලෝචන වාර්තාවට ඇතුළත් කර නොතිබුණු හෙයින් සැලසුමට අනුව ඒවායේ ප්‍රගතිය පරීක්ෂා කළ නොහැකි විය. | ප්‍රගති සමාලෝචන වාර්තාවට ඇතුළත් කිරීමට නොහැකි වී ඇත. | කාර්යසාධනය පරීක්ෂා කිරීමට හැකිවන ලෙස ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ප්‍රගති සමාලෝචන වාර්තාව සකස් කළ යුතුය |

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

---

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රවෘත්ති විකාශන වෙබ් අඩවි ලියාපදිංචිය සහ අලුත් කිරීම සඳහා මාර්ගගත පද්ධතියක් සකස් කිරීම, රූපවාහිනී හා ගුවන් විදුලි විකාශන බලපත්‍ර නිකුත් කිරීමේ යාන්ත්‍රණය නියාමනය සහ ශ්‍රී ලංකා රූපවාහිනී පනත සංශෝධනය කිරීම යන ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද නිම කර නොතිබුණි. | ප්‍රවෘත්ති විකාශන වෙබ් අඩවිය ලියාපදිංචි කිරීම සඳහා ආරක්ෂණ නිශ්කාෂණ ලබාගත යුතු බැවින් හා සම්මුඛ පරීක්ෂණයක් පැවැත්විය යුතු බැවින් තාවකාලිකව නතර කරන ලදී. රූපවාහිනී හා ගුවන් විදුලි විකාශන බලපත්‍ර නිකුත් කිරීමේ යාන්ත්‍රණය නියාමනයට විවිධ කරුණු බලපා තිබූ අතර ඉදිරියේදී ස්වයං මාධ්‍ය පාලනය මුල් කර ගෙන නව නීතියක් ගෙන ඒමට අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකා රූපවාහිනී පනත සංශෝධනය කිරීමට නීති කෙටුම්පත ඇතුළත් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා දේශපාලන අස්ථාවරත්වය නිසා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට බාධා ඇති වූ අතර වර්තමානයේ නැවතත් ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී. | සැලසුම් කළ කාලය තුළ කාර්යයන් නිම කිරීමට කටයුතු කළ යුතු වීම. |

**3.3 ප්‍රසම්පාදනයන්**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (අ) අනුව ප්‍රසම්පාදන කටයුත්තක් ආරම්භ කරන අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවරයන් ක්‍රමානුකූලව විස්තර කරමින් ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කළයුතු වුවද | ඉදිරියේදී විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අමාත්‍යාංශය විසින් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | | |
| (ආ) | **අමාත්‍යාංශ පරිශ්‍රය පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | | |
| | (i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1 (ඇ) පරිදි අවශ්‍ය අරමුදල් නොමැතිව ප්‍රසම්පාදන ක්‍රියාවන් ආරම්භ නොකළ යුතු වුවද වැය විෂයයන් 04 ක මුළු ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.79,500,000 ක්ව තිබියදී ඇස්තමේන්තුගත වටිනාකම රු.179,483,827 ක් වූ ප්‍රසම්පාදනයන් ආරම්භ කර පරිපූරක හා මු.රෙ.66 මාරුකිරීම් මඟින් රු.84,200,000 ක් ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. | අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ හඳුනා ගත් මූලික අවශ්‍යතා ආරම්භයේදී සැලසුම් කරන ලද අතර අදාළ කාර්යයන් සඳහා තාක්ෂණික උපදේශකත්වය ලබා ගන්නා ලද මධ්‍යම ඉංජිනේරු කාර්යාංශයේද උපදෙස් පරිදි සමස්ත අමාත්‍යාංශ ගොඩනැගිලි පරිශ්‍රයේ සියලු නවීකරණ කටයුතු එකවර ඉටු කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගන්නා ලද බැවින් පසුව ඇස්තමේන්තු සංශෝධනය වී ඇත. | -එම- |
| | (ii) ඇස්තමේන්තු වටිනාකම රු.179,483,827 ක් වූ අමාත්‍යාංශ පරිශ්‍රය නවීකරණය හා වැඩිදියුණු කිරීම කොන්ත්‍රාත්තුව උප කොටස් 12 ක් යටතේ අවස්ථා 04 කදී මිල කැඳවා 2021 දෙසැම්බර් 31 දිනට රු.113,404,335 ක් පමණ වැයකර තිබුණ ද, මෙම ප්‍රසම්පාදනයේ අවශ්‍යතාවය පැහැදිලිව හා විධිමත්ව හඳුනාගෙන නොතිබුණි. | මධ්‍යම ඉංජිනේරු කාර්යාංශයේ උපදෙස් මත උපකොටස් 12 අවස්ථා 04ක් යටතේ වර්ගීකරණය කර මිල කැඳවීම් සිදු කර ඇත. අදාළ සමස්ත කාර්යයම එක් කොන්ත්‍රාත්කරුවෙකුට ලබා දීම තුලින් සිදුවන ප්‍රමාදයන් සහ උප කොන්ත්‍රාත් ලබාදීම තුලින් මිල ගණන් ඉහළ යාමට වඩා ඍජුවම එම ආයතන වෙත ලබා දීමෙන් රජයට සිදු විය හැකි වාසිය හා කඩිනම් බව සලකා එසේ සිදු කර ඇත. | නවීකරණයන් සිදුකිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කළයුතුය. |

| | | |
|---|---|---|
| (iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (ආ) ප්‍රකාරව මෙම ප්‍රසම්පාදනයට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටුවට විෂය පිළිබඳ විශේෂඥයෙකු ඇතුළත්ව නොතිබුණි. | මෙම කාර්යයේ සමස්ත උපදේශන සේවාව මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යංශය වන බැවින් එම ආයතනයේ සිවිල් ඉංජිනේරුවන් මෙන්ම විදුලි ඉංජිනේරුවන් ඇතුළු සියලුම තාක්ෂණික ඉංජිනේරුවන් සිටින බැවින් අවශ්‍යතාවය ඒ හරහා ලැබෙනු ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (iv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.4 (ආ) පරිදි ප්‍රමාණවත් නොවන ලංසු සුරක්ෂණ හෝ ප්‍රමාණවත් නොවන ලංසු සුරක්ෂණ ප්‍රකාශන ආකෘති පත්‍ර විශාල බැහැරවීමක් වුවද සුළු බැහැරවීමක් සේ සලකා තාක්ෂණික ඇගයීම් නිර්දේශය ලබාදෙන ලෙස අමාත්‍යාංශ ලේකම් උපදේශක ආයතනයට දන්වා තිබුණි. එසේ වුවද 2021 ජූලි 20 දින උපදේශක ආයතනය අවම මිල ඉදිරිපත් කරන ලද ආයතනය ප්‍රතික්ෂේප කර දෙවන අවම ලංසුව ඉදිරිපත් කළ ආයතනය නිර්දේශ කර තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුව උපදේශක ආයතනයේ නිර්දේශ නොසලකා අවම මිල ඉදිරිපත් කරන ලද ආයතනය නිර්දේශ කර කමිටු අනුමැතිය මත 2021 ජූලි 22 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. | අමාත්‍යාංශ පරිශ්‍රය පුනරුත්ථාපනය කිරීම හා වැඩි දියුණු කිරීම යටතේ සදර්න් කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ඊංජිනියරින් (Southern Construction and Engineering (Pvt) Ltd) ආයතනය සමඟ 2021.08.05 දින ගිවිසුම් අත්සන් කර ඇත. ගිවිසුමේ මුල් පිටපත පාලන අංශයේ ගොඩනැගිලි නඩත්තු විෂය යටතේ ගොනු කර ඇත. | -එම- |

| | | |
|---|---|---|
| (v) අමාත්‍යාංශයේ විදුලි සෝපාන යන්ත්‍රය සවිකිරීමට අදාළ සිවිල් ඉංජිනේරුමය කාර්යයන් හා විදුලි සෝපානය සැපයීම, සවිකිරීම, ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීමට අදාළ ප්‍රසම්පාදනය සඳහා ඉදිරිපත් වී ඇති ලංසු දෙකම ප්‍රතිචාර නොදක්වන බැවින් අලුතින් ලංසු කැඳවීමට උපදේශන ආයතනය විසින් නිර්දේශ කර තිබුණි. එහෙත් අමාත්‍යාංශ ගොඩනැගිලි පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්වලට අදාළ කොන්ත්‍රාත්කරුට මිල ගණන් එම කොන්ත්‍රාත්තුව කැඳවීමකින් තොරව ලබාදී තිබුණි. | විදුලි සෝපානය සවි කිරීමේ කටයුතුද ගොඩනැගිල්ලේ අනෙකුත් නවීකරණ කටයුතු වලට සමගාමීව කළයුතු බැවින්ද කොවිඩ් වසංගත තත්වය හමුවේ ප්‍රමාදයන් සිදුවිය හැකි බැවින්ද අමාත්‍යාංශ නවීකරණයේ ලංසුකරුවන් 5 දෙනා වෙත පූර්ව ලංසු රැස්වීමේදී දැනුවත් කර සංශෝධිත මිල ගණන් ලබාගෙන තාක්ෂණික ඇගයීම් සිදුකොට ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබාගෙන කොන්ත්‍රාත්තුව පිරිනමා ඇත. | උපදේශන ආයතනයේ නිර්දේශ අනුව කටයුතු කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

---

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යවරයා වෙත වෙන්කර තිබූ වාහන 03 ක් සහ කාර්යමණ්ඩලය වෙත වෙන්කර තිබූ වාහනයක් 2022 ජූලි 20 වන විටද අමාත්‍යාංශය වෙත භාරදී නොතිබුණි. | එම වාහන භාරගැනීමට තවදුරටත් කටයුතු කරමින් පවතී. | වාහන අමාත්‍යාංශය වෙත ආපසු ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අවශ්‍යතාවයට වැඩියෙන් අත්තිකාරම් ලබාගත් අවස්ථා 02ක් සහ ලබාගත් අත්තිකාරම් උපයෝජනය කිරීමෙන් තොරව සම්පූර්ණයෙන්ම පියවූ අවස්ථා 02ක් පැවතුණි. | අත්තිකාරම් ලබාගැනීමේ වියදම් ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීමටත් අදාල කාර්යය ස්ථිරවම සිදුකරන්නේද යන්න තහවුරු කර ගැනීමෙන් පසු අත්තිකාරම් ලබා ගැනීමට කටයුතු කරන ලෙසත් දන්වා ඇත. | අවශ්‍යතාවයට අනුව අත්තිකාරම් ලබා දීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ඉදිරියේ දී අත්තිකාරම් ලබා දීමේ පාලනයක් ඇති කිරීමටත් කටයුතු කර ඇත. | |
| (ආ) | අමාත්‍යාංශය විසින් විකාශනයන් සිදුකරනු ලබන ආයතන 49 ක් වෙත නිකුත් කරන ලද බලපත්‍ර සඳහා නියමිත ගාස්තුව අයකර ගැනීමට මෙම වාර්තාවේ දින දක්වාම කටයුතු කර නොතිබුණි. | බලපත්‍රවල ඇතුළත් කොන්දේසි සංශෝධනය කර වර්තමානයට ගැලපෙන ආකාරයට සකස් කර බලපත්‍ර ගාස්තු අයකර ගැනීමේ නව ක්‍රමවේදයක් මේ දිනවල සකස් කර අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරගෙන යනු ලබන අතර එය ක්‍රියාත්මක වූ පසු ගාස්තු අය කිරීමට කටයුතු කරනු ඇත. | විධිමත් පරිදි බලපත්‍ර ගාස්තුවක් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | ගුවන් විදුලි විකාශනයන් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රලාභී ආයතන වෙත ලබා දී තිබුණු බලපත්‍රවල පවත්වාගෙන යා හැකි ගුවන් විදුලි නාලිකා ගණන සඳහන් කර නොතිබීම හේතුවෙන් ආයතන 20 ක් අතුරින් ආයතන 7 ක් ගුවන් විදුලි නාලිකා 2 ත් 5 ත් අතර ප්‍රමාණයක් එක් බලපත්‍රයක් යටතේ පවත්වාගෙන ගොස් තිබුණි. | බලපත්‍ර නිකුත් කරන ලද මුල් කාලවල (1991 වර්ෂයේ පමණ) බලපත්‍රය ලබාගන්නා අවස්ථාවේ එක් නාලිකාවක් පමණක් තිබී පසුව ක්‍රමයෙන් නාලිකා ප්‍රමාණය වැඩිකරගත් අවස්ථා ඇත. පසු කාලීනව බලපත්‍ර නිකුත් කිරීමේදී නාලිකා ප්‍රමාණය සීමා කර නිකුත් කර ඇත. කෙසේ වෙතත් ඉදිරියේදී සකස් කරගෙන යනු ලබන බලපත්‍ර ගාස්තු අය කිරීමේ ක්‍රමය තුළ මෙම අඩුපාඩුව නිවැරදි කරනු ඇත. | බලපත්‍ර තුළ පවත්වාගෙන යා හැකි නාලිකා ගණන පිළිබඳ කොන්දේසි ඇතුළත් කළ යුතුය. |
| (ඈ) | සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය රූපවාහිනී නාලිකා 02 ක් සහ ගුවන් විදුලි නාලිකා 02 ක් පවත්වාගෙන යන නමුත් 1982 අංක 06 දරන ශ්‍රී ලංකා රූපවාහිනී පනත හා 1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනත ප්‍රකාරව විකාශන බලපත්‍ර නිකුත් | සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය 1979 ජුනි 05 දිනැති අංක 39/04 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් රජයට පවරාගත් ආයතනයක් බැවින් බලපත්‍රයක් නිකුත් කර නොමැත. | සෑම විකාශන ආයතනයක් සඳහාම බලපත්‍ර නිකුත් කිරීමට විධිමත් පිළිගත හැකි ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කිරීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. | | |
| (ඉ) | රූපවාහිනී හා ගුවන් විදුලි විකාශන බලපත්‍ර නිකුත් කිරීමේදී කිසිදු බලපත්‍ර ගාස්තුවක් අයකර නොතිබුණු අතර වාර්ෂිකව හෝ කාලීනව බලපත්‍ර අලුත් කිරීමේ විධිමත් ක්‍රමවේදයක් අමාත්‍යාංශය විසින් හඳුන්වාදී නොතිබුණි. ඒ අනුව බලපත්‍ර ගාස්තු ලෙස හා බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු ලෙස ලබාගත හැකිව තිබූ විශාල ආදායමක් රජයට අහිමිවී තිබුණි. | අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලබන්නේ මූලික (ප්‍රාථමික) බලපත්‍රයක් වන අතර තාක්ෂණික බලපත්‍රයක් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මඟින් නිකුත් කරනු ලබයි. ඒ සඳහා බලපත්‍ර ගාස්තු වශයෙන් වාර්ෂික ගාස්තු ප්‍රමාණයක් අය කරනු ලබයි. ඒ අනුව රූපවාහිනී හා ගුවන් විදුලි විකාශන සඳහා රජයට සෑම ආයතනයක්ම ගාස්තුවක් ගෙවනු ලබන බැවින් රජයට බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු වාර්ෂිකව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හරහා ලැබෙනු ඇත. කෙසේ වෙතත් අමාත්‍යාංශ විසින් ඉදිරියේදී සකස් කරනු ලබන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් බලපත්‍රලාභී ආයතන වල වාර්ෂික මුළු පිරිවැටුමෙන් කිසියම් ප්‍රතිශතයක් කාර්තුමය වශයෙන් ගෙවීමේ පදනම මත අයකිරීමට යෝජනා වී ඇත. | බලපත්‍ර ගාස්තු ලෙස හා බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු අය කිරීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |
| (ඊ) | අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද **කේබල් ටීවී/ සැටලයිට් /අයිපීටීවී** බලපත්‍රවල ඇතුළත් කොන්දේසි අනුව මෙරට තුළ විකාශය කරන විදෙස් නාලිකාවන් සඳහා එය සම්ප්‍රේෂණය කරනු ලබන රටෙහි නිසි බලයලත් ආයතනයකින් ලබාගත් විකාශනයන් සඳහා බලපත්‍රයක් | පිළිතුරු ලැබී නැත. | බලපත්‍රවල ඇතුළත් කොන්දේසි අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හෝ අවසර පත්‍රයක් එම නාලිකාවන් මෙරට තුළ විකාශනය සඳහා අවසර ලබාගැනිමේදී ඉදිරිපත් කළයුතුය. එසේ වුවද **කේබල් ටීවී/ සැටලයිට් /අයිපීටීවී ටීවී** රූපවාහිනී විකාශනයන් සඳහා බලපත්‍ර ලබා සිටින ආයතන විසින් සිය නාලිකා කලඹ සඳහා නව විදේශ නාලිකා එක් කිරීමේදී අදාළ නාලිකා එකී අවශ්‍යතා සපුරා ඇති බව තහවුරු කර ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. | | |
| (උ) | සංස්ථාපනය කිරීමට පෙර අමාත්‍යාංශය විසින් 1992 දී ගුවන් විදුලි විකාශන සමාගමක් වෙත ලබාදී තිබුණු තාවකාලික විකාශන බලපත්‍රයේ කොන්දේසි කඩකිරීම හේතුවෙන් පවත්වාගෙන යනු ලැබූ එෆ්.එම්.ගුවන් විදුලි නාලිකාව අමාත්‍යාංශය විසින් තහනම් කර තිබුණි. අමතර කොන්දේසි 10 ක් ඇතුළත් කර වෙනත් නමකින් නාලිකාව ආරම්භ කිරීම 2007 සැප්තැම්බර් 14 දින අංක එම්එම්අයි/ඩීපී/3 දරන අමාත්‍ය ලේකම්ගේ ලිපියෙන් දැනුම් දී තිබුණි. එසේ වුවද තාවකාලික බලපත්‍රය අවලංගු කිරීමට හෝ අලුත් බලපත්‍රයක් නිකුත් කිරීමට හෝ පවත්නා බලපත්‍රයේ කොන්දේසි වෙනස් කිරීමට අවධානය යොමුකර නොතිබුණි. | පිළිතුරු ලැබී නැත. | බලපත්‍ර නිකුත් කිරීමේදී විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. |

**(ඌ) ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානය**

මහජන අදහස් හා සහභාගිත්වය තුලින් රාජ්‍ය ව්‍යුහය තුල ක්‍රමෝපායිකව තොරතුරු ගලායාම සඳහා අංක අමප/16/1675/702/059 හා 2016 අගෝස්තු 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ජාතික මාධ්‍ය මධ්‍යස්ථානයක් ස්ථාපනය කර තිබුණු අතර අපේක්ෂා කල අරමුණු ඉටු නොවීම හේතුවෙන් 2019 දෙසැම්බර් 05 දිනැති අමප/19/3332/203/002 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් එම මධ්‍යස්ථානය අහෝසිකර තිබුණි. රජයේ දස වැදෑරුම් රාජ්‍ය ප්‍රතිපත්තිය හා සංවර්ධන ව්‍යාපෘති ප්‍රගතිය නිවැරදිව ජනතාව වෙත සන්නිවේදනය කිරීමේ අරමුණින් ඉහත කී ජාතික මාධ්‍ය මධ්‍යස්ථානය 2021 ජනවාරි 04 දින පැවති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අලුතින් ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානය ලෙස නම්කර ස්ථාපිත කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක MMI /5/2/8/2020- LIII දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ පැවති යෝජනා අංක 02 අනුව පෙර පැවති ජාතික මාධ්‍ය මධ්‍යස්ථානය අහෝසි කිරීමේදී ආරක්ෂක අමාත්‍යාංශය වෙත පවරනු ලැබූ දැනට භාවිතයට නොගන්නා නිශ්චල හා චංචල දේපල නව ඒකකයට පැවරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණ ද, දේපල පවරා ගැනීමට කටයුතු නොකර කාර්යාල උපකරණ ලබාගැනීම සඳහා රු.3,511,398 ක් වැය කර තිබුණි. | පිළිතුර ඉදිරියේදී ඉදිරිපත් කරනු ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය මත කටයුතු කළ යුතුය. |
| (ආ) | අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ අනුව පෙර පැවති ජාතික මාධ්‍ය මධ්‍යස්ථානය අහෝසි කිරීමේදී එවකට එහි සේවය කළ සේවක | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| | පිරිසෙන් සැලකිය යුතු කොටසක් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර ඇති බැවින් එම සේවක සංඛ්‍යාව මඟින් ආවරණය කළ නොහැකි තනතුරු සඳහා පමණක් නව බඳවා ගැනීම් කළයුතු වුවද 2021 පෙබරවාරි 02 දින සිට 2022 අප්‍රේල් මාසය දක්වා කොන්ත්‍රාත් පදනමින් සේවකයින් 44 දෙනෙකු බඳවාගෙන තිබුණි. | | |
| (ඇ) | 2021 පෙබරවාරි 02 දින සිට වර්ෂයක කාලයක් සඳහා ප්‍රථමයෙන් මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා පත්කර තිබුණු අතර ඉන්පසු 2021 මාර්තු 02 දින සිට කොන්ත්‍රාත් පදනමින් කාර්ය මණ්ඩලයක් පත්කර තිබුණ ද, නිශ්චිත කාර්ය මණ්ඩලයක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කරගැනීමට කටයුතු කර නොතිබුණි. | -එම- | කාර්ය මණ්ඩලය අනුමත කර ගත යුතුය. |
| (ඇ) | ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානය 2021 පෙබරවාරි 17 දින සිට 2022 අප්‍රේල් 08 දක්වා වරින් වර නිලධාරීන් 44 දෙනෙකු සේවය කර තිබුණ ද පැමිණීම් වාර්තා නිසි පරිදි පවත්වාගෙන ගොස් නොතිබුණි. මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂකගේ ලිඛිත නිර්දේශයට අනුව එම කාලය තුළ සේවය කළ නිලධාරීන් වෙත රු. 18,637,988 ක දීමනාවක් අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි. එම ගෙවීම් වවුචර් වලද නිලධාරීන් විසින් | -එම- | පැමිණීම් වාර්තා නිසි ක්‍රමවේදයකට අනුව පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අත්සන් තබා නොතිබූ බැවින් එම මුදල් නිශ්චිතව අදාළ නිලධාරියා වෙත ප්‍රේෂණය වූ බව තහවුරු කරගත නොහැකි විය. | | |
| (ඉ) | 2021 මාර්තු 02 දින කොන්ත්‍රාත් පදනමින් පත්කළ මාධ්‍ය විමර්ශන නිලධාරීන් දෙදෙනෙකු හා කාර්යාල කාර්ය සහායකයෙකු 2021 සැප්තැම්බර් 01 දින ඉල්ලා අස්වී තිබුණු අතර නැවතත් එදින සිට පිළිවෙලින් එම සේවකයන් සහකාර අධ්‍යක්ෂ (මාධ්‍ය හා පාලන) ලෙස තනතුරු දෙකකට හා මාධ්‍ය විමර්ශන නිලධාරි තනතුරකට කොන්ත්‍රාත් පදනමින් පත්කර තිබුණි. | -එම- | කාර්ය මණ්ඩලය නිසි පරිදි අනුමත කරගෙන ඒ අනුව කටයුතු කළ යුතුය. |
| (ඊ) | ‘‘සෞභාග්‍යයේ දැක්ම’’ ජාතික වැඩපිළිවෙලෙහි සංවර්ධන තතු ජනගත කිරීම වෙනුවෙන් නිර්මාණය කළ ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානයේ ප්‍රධාන වෙබ් අඩවිය mcnd.gov.lk ඩොමේන් නාමය යටතේ පවත්වාගෙන යන අතර, එම වෙබ් අඩවිය ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවතුණි. | -එම- | වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------------**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වන විට අමාත්‍යාංශයේ අනුමත සේවක සංඛ්‍යාව 158 ක් හා තථ්‍ය සේවක සංඛ්‍යාව 104 ක් වූයෙන් පුරප්පාඩු 54ක් පවතින අතර එහි ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු 06ක් ඇතුළත් වී තිබුණි. | පිළිතුරු ලැබී නැත. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |